# ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
## ග්‍රාමීය සංවර්ධන කාර්යාංශය

## ව්‍යාපෘති යෝජනා කැඳවීම : තිරසාර ජීවනෝපායන් තුළින් ප්‍රජාව සවිබලගැන්වීම සඳහා නවෝත්පාදිත ව්‍යාපාරික අවස්ථා බිහිකිරීම

ග්‍රාමීය සංවර්ධන සමාජ ආරක්ෂණ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රජාශක්ති දිළිඳුබව තුරන් කිරීමේ ජාතික ව්‍යාපාරය රජයේ ප්‍රමුඛතම සංවර්ධන ප්‍රවේශයක් වන අතර එමගින් ග්‍රාමීය හා වතු අංශය තුළ පවතින බහුමාන දරිද්‍රතාව අවම කිරීම කෙරෙහි මූලික අවධානය යොමුකර ඇත. බිම් මට්ටමේදී ප්‍රජාව මුහුණදෙන ගැටළු හඳුනාගැනීම හා ප්‍රමුඛතාගත කරන ලද ගැටළු සඳහා වඩාත් උචිත විසඳුම් සෙවීම සඳහා ප්‍රජාවගේ සක්‍රීය දායකත්වය ලබා ගැනීමට ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් ස්ථාපිත කර ඇති "ප්‍රජා සංවර්ධන සභාව (CDC)" වඩාත් ශක්තිමත් කිරීම ප්‍රජාශක්ති ව්‍යාපාරය මගින් ඉලක්කගත කර ඇත.

ඊට සමගාමීව' ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය මගින් මෙම ජාතික මෙහෙවර ඉටුකිරීම සඳහා රැකියා වැඩි සංඛ්‍යාවක් ජනනය කරණු ලබන හා අගයදම ක්‍රියාවලිය තුළ තනි පුද්ගල හෝ පවුල් ඒකක ප්‍රධාන පාර්ශවකරුවන් කරගනු ලබන (උදා: කොන්ත්‍රාත්කරුවන් ලෙස, සැපයුම්කරුවන් හෝ උපකොන්ත්‍රාත් කරුවන් ලෙස) ප්‍රශස්ත ආර්ථික ශක්‍යතාවයක් හා තිරසාර මෙන්ම නවෝත්පාදන ව්‍යාපාරයන් ඇරඹීම සඳහා ව්‍යාපාරික ප්‍රජාවට හා ආයතන සඳහා මෙම වැඩසටහන මගින් අවස්ථාව විවර කර ඇත. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව වසර 1සිට 3 දක්වා වේ.

**මෙම වැඩසටහන තුළින් අපේක්ෂා කරනුයේ ;**

- අපනයනාභිමුඛ හා අගය එකතු කළ කර්මාන්ත තුළින් ආදායම් උත්පාදනය වැඩිකිරීම.
- දේශීය සම්පත් උපයෝගී කරගනු ලබන මධ්‍යම හා මහා පරිමාණ ව්‍යවසායන්ට සහය ලබා දීම.
- තිරසාර ජීවනෝපාය හා ස්වයං රැකියා ප්‍රවර්ධනය

**යෝජනා ඉදිරිපත් කිරීම සඳහා සුදුසුකම් ලබන හවුල්කරුවන්;**

පහත වර්ගීකරණය, කරනු ලබන ආයතන සහ සංවිධාන ව්‍යාපාර ආයෝජන යෝජනා ඉදිරිපත් කිරීම සඳහා සුදුසුකම් ලබයි;

- ඉහළ කාර්යසාධන මට්ටමක් තහවුරු කරන ලද පුද්ගලික අංශයේ ආයතනයන්
- ක්‍රියාත්මක කළ හැකි මට්ටමේ නවමු ව්‍යාපාරික යෝජනා ඉදිරිපත් කරන ව්‍යාපාරිකයන්
- දිළිඳුකම පිටුදැකීමේ වැඩසටහන් සම්බන්ධ පළපුරුද්ද සහිත රාජ්‍ය නොවන සංවිධාන.
- වාණිජමය ක්‍රියාකාරකම් වල නිරතවී සිටින රාජ්‍ය ව්‍යවසායකයන්
- සමුපකාර සමිති.
- පළාත් පාලන ආයතන

(රාජ්‍ය, පෞද්ගලික, ජනතා හවුල්කාරීත්ව (4P Mode) යටතේ ස්වකීය ව්‍යාපාරික යෝජනා ඉදිරිපත් කිරීම සඳහා අයදුම්කරුවන් දිරිමත් කරනු ලබන අතර කාන්තාමූලික, තරුණ ප්‍රජාව ප්‍රමුඛකරගත් හා සමාජය තුළ වඩාත් අවදානම්කාරී තත්ත්වයන්ට ගොදුරු වී සිටින ප්‍රජා බාණ්ඩ මූලික කරගත් ව්‍යාපාරික යෝජනා සඳහා ඉහළ ඇගයීමක් ලබා දේ.)

**විෂයපථය හා ප්‍රමුඛතා අංශ :**

ඕනෑම අංශයක් යටතේ ව්‍යාපාරික යෝජනා ඉදිරිපත් කළ හැකි අතර පහත දැක්වෙන අංශ සඳහා ප්‍රමුඛතාවය ලබා දේ.

- අපනයනාභිමුඛ කෘෂිකර්ම හා කෘෂි – පාදක කර්මාන්ත
- පශු සම්පත්, ධීවර හා ජලජීවී
- ආහාර සැකසුම් නිෂ්පාදන හා අගය එකතුකළ නිෂ්පාදන
- තොරතුරු තාක්ෂණය (ICT) ආශ්‍රිත සේවාවන් හා හරිත, ව්‍යාපාර දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කරන ව්‍යාපාර

**සමඅරමුදල් සැපයීම**

බහුවිධ දරිද්‍රතාවයෙන් පෙළෙන පවුල් සඳහා සම්ප්‍රදායික සුබසාධක න්‍යායෙන් ඔබ්බට ගිය ස්ථාවර ආර්ථික සවිබලගැන්වීමක් වෙනුවෙන් අරමුදල් සපයාදීම හෝ ඉහළ විභවයක් සහිත නවෝත්පාදන ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා ආධාර ලබාදීමට අමාත්‍යාංශය අපේක්ෂා කරනු ලබයි. මෙම අරමුණ ළඟාකර ගැනීම උදෙසා ප්‍රමුඛ අංශ හතරෙන් එක් අංශයක් සඳහා උපරිමය රු.මි.250ක් වෙන් කෙරේ. ඒ අනුව, අවමය රු.මි. 50 ක් සහ උපරිමය රු.මි.200 ක් වන පරිදි ව්‍යාපාර යෝජනා ඉදිරිපත් කරන මෙන් සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. යෝජිත ව්‍යාපාරවල ස්වභාවය මෙන්ම සමාජීය සහ ආර්ථික බලපෑම මත පදනම්ව තෝරාගත් ව්‍යාපෘති සඳහා සමඅරමුදල් දායකත්වය සැපයීමේදී අමාත්‍යාංශය නම්‍යශීලී ප්‍රවේශයක් අනුගමනය කරනු ඇත. යෝජිත ව්‍යාපාරය ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශයෙන් ඉල්ලා සිටින ආධාරයේ ස්වභාවය හා අවශ්‍යවන සමඅරමුදල් ප්‍රතිශතය අයදුම්කරුවන් විසින් පැහැදිලිව සඳහන්කර තිබීම අනිවාර්යය වේ.

**යෝජනා ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍යතා :**

අයදුම්කරුවන් විසින් අදාළ ව්‍යාපාර යෝජනා ලබාදීම සඳහා අමාත්‍යාංශ වෙබ් අඩවිය වන www.mrds.gov.lk වෙතින් බාගත කළ හැකි විධිමත් අයදුම්පත් ආකෘතිය පමණක් භාවිත කළ යුතුය. එසේම අදාළ ව්‍යාපාර යෝජනා ඇගයුම් නිර්ණායක ද අදාළ අමාත්‍යාංශ වෙබ් අඩවිය වන www.mrds.gov.lk වෙතින් ලබාගත හැක.

**අනිවාර්ය ලේඛන :**

- සම්පූර්ණ කළ අයදුම්පත් ආකෘතිය.
- ව්‍යාපාරිකයන් සහ ව්‍යවසායක කණ්ඩායම් සඳහා ව්‍යාපාර ලියාපදිංචි කර ඇත්නම් ව්‍යාපාර ලියාපදිංචි සහතිකය.
- අදාළත්වය අනුව අධ්‍යක්ෂ මණ්ඩල විස්තර.
- මේ දක්වා අත්දැකීම්, නිමකරන ලද ව්‍යාපෘති / ව්‍යාපාර විස්තර සමග බිම්මට්ටමින් සනාථ කළහැකි සාක්ෂි.

**භාරදීමේ ක්‍රමවේදය හා අවසන් දිනය**

- **භාරදීමේ ක්‍රමවේදය :** දෘඪ පිටපතක් වශයෙන්
- **ශීර්ෂය :** "තිරසාර ජීවනෝපායන් තුළින් ප්‍රජාව සවිබලගැන්වීම සඳහා නවෝත්පාදිත ව්‍යාපාරික අවස්ථා බිහිකිරීම" ලෙසට අදාළ යෝජනා බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.
- **ලිපිනය**

  **ලේකම්, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය, ග්‍රාමීය සංවර්ධන කාර්යාංශය, 09 වන මහල, අදියර II, සෙත්සිරිපාය, බත්තරමුල්ල.**
- **අවසන් දිනය :** 2026 මාර්තු 16 වන සඳුදා දින දහවල් 12.00 ට පෙර

  ප්‍රමාද වී ලැබෙන හා අසම්පූර්ණ අයදුම්පත් සලකා බලනු නොලැබේ. සම්පූර්ණ කළ අයදුම්පත් අතිරේක මෙම අමාත්‍යාංශයේ ග්‍රාමීය සංවර්ධන අංශයේ අතිරේක ලේකම්වරයාගේ නිල කාමරය තුළ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමෙන් හෝ ඉහත ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් ලැබීමට සැලැස්විය යුතුය. අදාළ භාර ගැනීමේ කාලය අවසන් වූ වහාම, බත්තරමුල්ල, සෙත්සිරිපාය අදියර II, 1 වන මහලේ ප්‍රධාන ශ්‍රවණාගාරයේදී, ලැබී ඇති යෝජනා විවෘත කරනු ලැබේ.

**අවශ්‍ය වැඩිදුර තොරතුරු සඳහා :**

තෝරාගනු ලබන අයදුම්කරුවන් යථා කාලයේදී දැනුවත් කරනු ලබන අතර, ඔවුන්,

- සම්මුඛ පරීක්ෂණ සඳහා සහභාගී විය යුතු අතර, ක්ෂේත්‍රයට අදාළව ඉටුකරන ලද කාර්යයන් නිරීක්ෂණය කිරීම සඳහා පහසුකරණය සැලසිය යුතුය.
- අවශ්‍යතාවය පරිදි අමතර තොරතුරු හෝ ලේඛන ඉදිරිපත් කළ යුතුය.

ලැබෙන ඕනෑම යෝජනාවක් කිසිදු හේතු දැක්වීමකින් තොරව පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට ඇති අයිතිය ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය සතුවේ.

උනන්දුවක් දක්වන අයදුම්කරුවන්හට අවශ්‍ය පැහැදිලි කිරීම් හෝ වැඩිදුර විස්තර 2026 මාර්තු 13 දිනට පෙර ruraldevelopmentbureau@gmail.com වෙත ඊමේල් පණිවිඩයක් එවීමෙන් ලබාගත හැකිය.

**ලේකම්, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය,**
**1 වන මහල, සෙත්සිරිපාය, අදියර II, බත්තරමුල්ල,**
**2026.02.12**